ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය - 2016

---------------------------------------------------------------------------------------------

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 සැප්තැම්බර් 28 දිනැති අංක 1673/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයෙන් ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ රෙගුලාසිවල 10.3 ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ඉහත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 යෝජනා ක්‍රමයේ අරමුණු

---------------------------

මුදල් නීති පනතේ (422 අධිකාරය) 32 ඊ වගන්තිය යටතේ මුදල් මණ්ඩලයේ සභාපතිවරයා විසින් 2010 සැප්තැම්බර් 28 දිනැති අංක 1673/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රසිද්ධ කරන ලද රෙගුලාසි යටතේ යෝජනා ක්‍රමය පිහිටුවන ලදී. යෝජනා ක්‍රමයේ ප්‍රධාන අරමුණ වනුයේ මූල්‍ය ආයතන අසාර්ථක වීමෙන් කුඩා තැන්පත්කරුවන් ආරක්ෂා කරගැනීම සඳහා මූලික යාන්ත්‍රණයක් පිහිටුවීම තුළින් කුඩා තැන්පත්කරුවන්ගේ විශ්වාසය පවත්වා ගැනීම මඟින් මූල්‍ය ආයතනවල ස්ථාවරත්වය වර්ධනය කරගැනීමයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක

සැලකිල්ලට ගන්නා නමුත් යෝජනා ක්‍රමයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මතය**

------

මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**3. මූල්‍ය සමාලෝචනය**

---------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ යෝජනා ක්‍රමයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය, බදුවලට පෙර රු. මිලියන 8,839.37 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 6,868.52 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 1,970.85 ක හෙවත් සියයට 22.3 ක වර්ධනයක් දැක්වුණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මුළු වියදම රු. මිලියන 249 කින් වැඩිවීමට එරෙහිව මුළු ආදායම රු. මිලියන 2,219.85 කින් වැඩිවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

-----------------------------------

**3.2.1 අරමුදලෙහි තත්ත්වය**

---------------------

යෝජනා ක්‍රමයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ අරමුදලේ ශේෂය, ඉකුත් වර්ෂය අවසානයේ අනුරූපී ශේෂය වන රු. මිලියන 25,417.9 ක් හා සැසඳීමේදී රු. මිලියන 8,839 කින් හෙවත් සියයට 34.7 කින් වැඩි වී තිබුණි.

**3.3 මෙහෙයුම් සමාලෝචනය**

**-----------------------------**

**3.3.1 හඳුනාගත් පාඩු**

**----------------**

ප්‍රාථමික ගනුදෙනුකරුවකු විසින් ගිවිසුම කඩකිරීම හේතුවෙන් 2016 මාර්තු 31 දින කල්පිරෙන ප්‍රතිවර්ත ප්‍රතිමිලදීගැනීම් ආයෝජනයන් (භාණ්ඩාගාර බැඳුම්කර) රු. 144,251,239 ක හානිකරණ පාඩුවක් හඳුනාගෙන තිබූ අතර, ඒ අනුව 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හානිකරණ වෙන්කිරීමක් කර තිබුණි.

ප්‍රාථමික ගනුදෙනුකරුවකු විසින් වංචනිකව යෝජනා ක්‍රමයට දැන්වීමෙන් තොරව වෙනත් ආයෝජකයින්ට අලෙවි කරන ලද සුරැකුම් වෙනුවට වෙනත් සුරැකුම් යෝජනා ක්‍රමයේ නමට තබා නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.